BRITISH COUNCIL

ශිෂ්‍ය සහ දෙමාපිය මාර්ගෝපදේශ සහ චර්යා සංග්‍රහය

# බ්‍රිතාන්‍ය කවුන්සිල ඉගැන්වීම් මධ්‍යස්ථානය

ප්‍රාථමික සහ ද්විතීයික සිසු සිසුවියන් සඳහා ඉංග්‍රීසි පාඨමාලා

www.britishcouncil.org

# බ්‍රිතාන්‍ය කවුන්සිල ඉගෙනීම් මධ්‍යස්ථානය ගැන හැඳින්වීමක්

**සිසු සිසුවියන්ගේ පවුලේ අය වෙතටයි,**

**ඔබේ දරුවාගේ පාඨමාලාව සම්බන්ධයෙන් ඉගෙනීම් මධ්‍යස්ථානයක් හඳුන්වාදීමට බ්‍රිතාන්‍ය කවුන්සිලය කටයුතු කර ඇත. ඉංග්‍රීසි භාෂාව ඉගෙනීමේ දී ඔබේ දරුවාට උපරිම ඵල ලබාගැනීමට එය උපකාරී වනු ඇත.**

**ඉගෙනීම් මධ්‍යස්ථානය ආරක්ෂිත සේ ම ඔන්ලයින් අවකාශය ද සුරක්ෂිත බැවින් තම ගුරුවරයා විසින් සකසන ලද ක්‍රියාකාරකම් වල නිරතවීම දරුවාට සතුටක් වනු ඇත. එවිට තමා මනා සූදානමකින් ඇතැයි ඔබේ දරුවාට සිතෙනු ඇත. එසේම, ඔන්ලයින් හරහා පංති පැවැත්වෙන විට, ඔබේ දරුවාට පංතිය වෙත ප්‍රවේශවීමේ හැකියාව ද ඇත.**

**පංතිය වේලාවේ දී සහ ඉන් පසුව ද කියැවීම සහ සවන්දීම වැනි කුසලතා වැඩිදියුණු කරගැනීම සතුට උපදවන අයුරින් සිදුකළ හැකි වන නිසා, පංතියේ දී ඉංග්‍රීසි භාෂාවෙන් කතා කිරීමට පුරුදුවීම සඳහා වැඩි අවස්ථාවක් ඔබේ දරුවාට ලැබෙනු ඇත.**

**මෙය නිර්මාණය කර ඇත්තේ දරුවන්ට වැඩි ප්‍රගතියක් ලබාගැනීමට හැකිවන ආකාරයට සහ ඔවුන් දිරිගන්වමින් ආත්ම-විශ්වාසය ගොඩනැගෙන ආකාරයට ය.**

**බ්‍රිතාන්‍ය කවුන්සලයේ අප, මුහුණට-මුහුණ ලා පවත්වන පංති වල දී මෙන්ම Virtual පංතිකාමර වලදී ද ළමුන්ගේ සහ නව යොවුන් අයගේ ආරක්ෂිත භාවය, සුභ-සිද්ධිය සහ ආරක්ෂණය ගැන අතිශයින් සැලකිලිමත් වේ. කරුණාකර මෙම ලේඛනය කියැවීමේ දී ආරක්ෂා කිරීම පිළිබඳ අපගේ ප්‍රතිපත්තිය ද සමග එය කියවා බලන්න. ඔබට එම ප්‍රතිපත්තිය මෙතැනින් කියවිය හැකියි.**

## සමග ඉදිරියට යන ගමනේ දී

සියලුදෙනාගේ ම ආරක්ෂාව උදෙසා, ඉගැන්වීම් මධ්‍යස්ථානය වෙත ප්‍රවේශ වන සියලුම සිසු සිසුවියන් විසින් පහත නීතිරීති අනුගමනය කළ යුතුයි.

# ඉගැන්වීම් මධ්‍යස්ථානය භාවිත කිරීමේ පොදු නීතිරීති

සියලුදෙනාගේම ආරක්ෂාව උදෙසා, ඉගැන්වීම් මධ්‍යස්ථානය වෙත ප්‍රවේශ වන සියලුම සිසු සිසුවියන් විසින් පහත නීතිරීති අනුගමනය කළ යුතු වේ:

- ඉගැන්වීම් මධ්‍යස්ථානය භාවිත කිරීම සඳහා දෙමාපියන් විසින් තම දරුවාට සිය කැමැත්ත ලබාදිය යුතුයි.
- ප්‍රවේශ වීමේ තොරතුරු අන් අයට ලබා නොදිය යුතුයි.
- තමන් කළ වැඩ, ඉගැන්වීම් මධ්‍යස්ථානය වෙත උඩුගත (upload) කරන විට කිසිදු පුද්ගලික තොරතුරක් හෝ ඡායාරූප හෝ අනිසි දෑ කිසිවක් ඊට අඩංගු නොකළ යුතුයි.
- ඔන්ලයින් මගින් සම්පූර්ණ කළ වැඩ වල කොටසක් ලෙස ලිපින, විද්‍යුත් තැපැල් ලිපින හෝ දුරකථන අංක වැනි කිසිදු පුද්ගලික තොරතුරක් බෙදා-හදා නොගත යුතුයි.

# සමූහ සාකච්ඡා වලදී පිළිපැදිය යුතු නීති

අධ්‍යයනය කරනු ලබන මාතෘකා පිළිබඳ අදහස් හා උදහස් සහ පොදුවේ, ඉංග්‍රීසි භාෂාව ඉගෙනීම ගැන කරුණු, සමූහ සාකච්ඡාවක දී බෙදා-හදා ගැනීමට ගුරුවරුන් හා සිසු සිසුවියන් හට හැකිය. සිසු සිසුවියන්ට සාකච්ඡා ආරම්භ කළ නොහැකි නමුත්, ඔවුන්ගේ ගුරුවරුන් විසින් ආරම්භ කළ සාකච්ඡාවන්ට සහ අනෙකුත් සිසු සිසුවියන් විසින් පළ කරන අදහස් වලට පිළිතුරු ලෙස, තමන්ගේ අදහස (පෝස්ටු), ගැළපෙන රූප (images) සහ URLs පළ කළ හැකිය. සමූහ සාකච්ඡා භාවිත කරන විට, පහත දක්වා ඇති නීතිරීති අනුගමනය කරන ලෙසට සිසු සිසුවියන්ගෙන් අප ඉල්ලා සිටිමු.

- සියලුම පෝස්ටු ඉංග්‍රීසි භාෂාවෙන් පළ කළ යුතුයි. වෙනත් කිසියම් භාෂාවකින් පළ කරන පෝස්ටු ඉවත් කෙරෙයි.
- විද්‍යුත් තැපැල් ලිපින, දුරකථන අංක සහ ‘නරක හෝ අනිසි’ භාෂාව භාවිතයට අවසර නැත.
- ලියකියවිලි/ගොනු බෙදා-හදා ගන්නා වෙබ්අඩවි කිසිවක සබැඳි පළ කිරීම සිසු සිසුවියන් විසින් නොකළ යුතුයි: එවැනි සබැඳි තිබුණහොත් ඒවා ඉවත් කෙරෙනු ඇත.
- සැලකිල්ල යොමු විය යුතු යම් කරුණක් හෝ පෝස්ටුවක් සාකච්ඡාවක දී සිසු සිසුවියන් හට දක්නට ලැබුණහොත්, සිය ගුරුවරයා වෙත ඔවුන් විසින් ඒ බව වහාම දැනුම් දිය යුතුයි.
- චර්යාව පිළිබඳ මෙම ප්‍රතිපත්තියට අනුව කටයුතු කිරීමට අපොහොසත් වීම, පාඨමාලාවට අදාළ සිසුවාගේ සහභාගිවීම තාවකාලිකව නතර කිරීමට හෝ බැහැර කිරීමට හෝ හේතුවනු ඇත.

ඉහත නීති සහ බ්‍රිතාන්‍ය කවුන්සිලයේ ප්‍රතිපත්ති අනුගමනය කරන බවට සහතික වීම පිණිස, සියලු සාකච්ඡාවන් නිරන්තර අධීක්ෂණයට බඳුන් කෙරෙනු ඇත.

# Virtual පාඩම්

සිසු සිසුවියන් සඳහා වන ඉගැන්වීමේ අත්දැකීම් අන්තර්ජාලය හරහා පවත්වන පංති කාමරයක (virtual classroom) දී පැවැත්විය හැකිය. Virtual පාඩම් නිර්මාණය කර ඇත්තේ සිසු සිසුවියන් තුළ ආත්ම-විශ්වාසය ගොඩනැගීමට, කථාව පුහුණුවීමට, කුසලතා සංවර්ධනයට මෙන්ම සාමාන්‍ය පංතියක දී සේ ම ප්‍රගතිය ඇති කිරීමට උපකාරී වන අන්දමට ය.

# Virtual පංති සඳහා චර්යාධර්ම සංග්‍රහය

Virtual පංති වලට සහභාගි වන සිසු සිසුවියන් තමන්ගේ හැසිරීම සම්බන්ධයෙන් වගකීමෙන් කටයුතු කළ යුතු අතර, මුහුණට-මුහුණ ලා කටයුතු කරන පංතියක දී අනුගමනය කරන සියලු ප්‍රතිපත්ති අනුගමනය කිරීමට මතක තබාගත යුතුය. අන් අයට හිරිහැර කිරීම් සම්බන්ධයෙන් බ්‍රිතාන්‍ය කවුන්සිලය අනුගමනය කරන ශූන්‍ය ඉවසීමේ (zero tolerance stance on bullying) ප්‍රතිපත්තියට අනුකූල වීමද මීට අයත් වේ.

එකී අපේක්ෂාවන්ට අමතරව, මෙකී නීතිරීති අනුගමනය කරන ලෙසට ද අපගේ සිසු සිසුවියන් වෙතින් ඉල්ලා සිටිමු.

# මනා හැසිරීම

Virtual පංති වලට සහභාගි වන සියලුදෙනා එකිනෙකා කෙරෙහි ගෞරවයෙන් කටයුතු කළ යුතු වේ. පහත කරුණු සම්බන්ධයෙන් පූර්ණ සහයෝගය ලබදෙන ලෙසට සියලුම සිසු සිසුවියන් වෙතින් අප ඉල්ලා සිටිමු.

- මිත්‍රශීලී වන්න
- සියලුදෙනා ඇතුළත් වන අයුරින් කටයුතු කරන්න - ක්‍රියාකාරකම් වලදී අන් අය එකතු කරගන්න
- සහභාගි වන්න - ගුරුවරයා විසින් කියා සිටින ක්‍රියාකාරකම් වලට සහභාගි වන්න
- ගුරුවරයාගේ උපදෙස් වලට සවන් දී, ඒවා අනුගමනය කරන්න
- අන් අයට සවන්දීමට සහ කතා කිරීමේ අවස්ථාව ඔවුන්ට ද ලබාදීමට කාරුණික වන්න
- තමන්ගේ කැමරාවෙන් පෙන්නුම් කෙරෙන්නේ තමන් පමණක් බවට සහතික වන්න
- යම් කරුණක් පිළිබඳ සතුටට පත් නොවේ නම්, ගුරුවරයාගෙන් උදව් ඉල්ලා සිටින්න නැතිනම්, තමන් විශ්වාස කරන වැඩිහිටියෙකුට ඒ ගැන දන්වන්න.
- සෑම විටෙකම කැමරාව ක්‍රියාත්මකව තබන්න..

# කළ යුතු වෙනත් දෑ

- සිසු සිසුවියන් විසින් සිය ගිණුම් සකස් කළ යුතුතේ සිය මුල් නම සම්පූර්ණයෙන් හා වාසගම දැක්වෙන පරිදි වාසගමේ මුල් අකුර (උදා: හුවාන් ආර් හෝ කිම් වයි) යොදාගනිමිනි. පංතියේ නාමලේඛනය හා නොගැළපෙන නමක් සහිත සහභාගිවන්නන් හට පංතිකාමරයට එක්වීමට අවසර නොමැත.

# තහනම් වූ හැසිරීම් රටා

පහත චර්යාවන්ට අවසර නොමැත

- හිරිහැර කරන ආකාරයෙන්
- හිතාමත අකීකරුවීම
- අන් අය කෙරෙහි වෙනස්කොට සැලකීම
- කිසිදු භාෂාවකින් නුසුදුසු වචන භාවිතය
- පාඩම් වේලාවේ දී දුරකථනය භාවිතය
- ඇමතුම් වලට බාධා වන මාදිලියේ මෘදුකාංග හෝ මෙවලම් භාවිතය
- නුසුදුසු බවට සැලකිය හැකි දෑ අන් අය හා බෙදා-හදා ගැනීම
- Virtual පංති පටිගත කිරීම
- සිසුවා හැරෙන්නට වෙනත් අය කැමරාවෙන් දිස්වීමට ඉඩ හැරීම
- Virtual පංතිකාමරයේ ඉගෙන ගන්නා අනෙකුත් සිසු සිසුවියන්ට හැර වෙනත් අයට අන් සිසු සිසුවියන් හා සම්බන්ධවීමට ඉඩ හැරීම

ඉහත නීතිරීති වලට අනුව කටයුතු කිරීමට අපොහොසත් වුවහොත්, ඊට වගකිව යුතු සිසුවා පංතියට සහභාගිවීම තාවකාලිකව නතර කිරීමට හෝ බැහැර කිරීමට හෝ හේතුවනු ඇත.

# Virtual පංති සූදානම් කිරීම සඳහා මාර්ගෝපදේශ.

## සූදානම් වන්න!

### ඔබව පෙනෙන ඇසෙන බව තහවුරු කරගන්න

Virtual පාඩම් වලට පූර්ණ වශයෙන් සහභාගිවීමට නම් සිසුවාට කැමරාවක් ද තිබිය යුතු වේ. ඔබ යම් දිනෙක Skype, FaceTime හෝ වෙනත් විඩියෝ මගින් කතා කිරීමේ යෙදුමක් භාවිත කර ඇත්නම්, මෙය ද බොහෝ දුරට ඒ හා සමාන ය. පංතිය පුරාවට ගුරුවරයා හෝ අනෙක් සිසු සිසුවියන් සමග කතා කිරීම සඳහා Ear/headphones සමග ඒ හා සවි කර ඇති මයික්‍රොෆෝනයක් ද අවශ්‍ය වේ.

පංතිය ආරම්භ කිරීමට පෙර, ඔබේ විඩියෝව සහ මයික්‍රොෆෝනය නිසි ලෙස ක්‍රියා කරන්නේදැයි පරීක්ෂා කර බලන්න.

### නිශ්ශබ්ද තැනක් තෝරාගන්න

Virtual පංති වල ඇති ලොකුම වාසිය නම්, කොතැන සිට පංතියට සහභාගි වන්නේ ද යන්න තමාට තෝරාගත හැකි වීමයි. වඩාත් හොඳ අත්දැකීමක් ලැබීමට, අන් අයගෙන් සහ ශබ්ද වලින් බාධාවක් ඇති නොවන තැනක් තෝරාගන්න. බාධාවන් ඇති වීම සහ නිතර නිතර සිටින තැන වෙනස් කිරීමට සිදුවීම නිසා ඉගෙනීම සම්බන්ධයෙන් හොඳ අත්දැකීමක් ලැබීමට තමන්ට නොහැකි වනු ඇත.

ජංගම දුරකථනයක් හෝ ටැබ්ලටයක් වෙනුවට මේසය හෝ උකුළ මත තබන (desktop/laptop) පරිගණකයක් භාවිත කරන්න.

### මනාව සම්බන්ධ වී සිටින්න

ඔබට මනා අන්තර්ජාල සබඳතාවක් තිබීම අත්‍යවශ්‍ය වේ. අන්තර්ජාල සබඳතාව දුර්වල නම්, ගුරුවරයා සහ අන් අය කියන දෑ අසන්නට හා ඔවුන් දකින්නට ඔබට අපහසු වනු ඇත. එය සියලුදෙනාටම අපහසුකාරී වනු ඇත.